24/08/2011 – දිනමිණ

**ඡායාරූපය**



හිටපු අමාත්‍යවරයකු හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකවරයකු හා ශ්‍රී ලංකා ජාතික කොංග්‍රසයේ නායක මිලින්ද මොරගොඩ මහතා ඊයේ (23) අරලියගහ මන්දිරයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතින් ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ සාමාජිකත්වය ලබා ගත් අයුරු. ඒ මහතා එළඹෙන පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ මහ නගර සභා නගරාධිපති අපේක්‍ෂකයා වශයෙන් ද තරඟ කිරීමට නියමිතය. එජාප හිටපු මහ ලේකම්වරයකු සහ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයකුවූ බී.සිරිසේන කුරේ මහතාගේ පුත් මංජුල ප්‍රසන්න කුරේ සහ ආර්.එම්.සම්පත්, බී.පී.සිරිනිමල් ද සිල්වා,යමුනා ගනේෂලිංගම් මහත්ම මහත්මීහුද ජනාධිපතිතුමා අතින් ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ පක්ෂ සාමාජිකත්වය ලබා ගත්හ. මෙම අවස්ථාවට සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගි වූහ.

*ඡායාරූපය - සුදත් සිල්වා*